**කොන්ක්‍රීට් කණුමත දිවෙන වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතිය - 2021**

**-------------------------------------------------------------------**

කොන්ක්‍රීට් කණුමත දිවෙන වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2019 ජනවාරි 17 දින එළඹි අංක 3716 - එස්ආර්අයි දරන ණය ගිවිසුමේ  ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි සැලකෙන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**--------------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මහා මාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ ආයතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මෙම ව්‍යාපෘතිය නව කැළණි පාලමේ සිට ගාලු මුව දොර දක්වා වූ වරාය හා යෝජිත බහු මාදිලි ප්‍රවාහන කේන්ද්‍රස්ථානය කි. මී. 5.3 ක් දිගැති මංතීරු 4ක් ඉදිකිරීම සඳහා ඇති කර තිබුණි. ආර්ථික ක්‍රියාකාරකම් සඳහා ධනාත්මක බලපෑමක් ඇති කිරීම සහ කොළඹ නගරයේ රථවාහන තදබදය අවම කිරීම සඳහා අපේක්ෂා කරන කලාපීය ප්‍රතිලාභ ලබා දීම,කොළඹ සිට කටුනායක ගුවන්තොටුපල දක්වා ගමන් කාලය අඩුකිරීම සහ වරායේ සිට කොළඹ වෙනත් ප්‍රදේශයන්ට භාණ්ඩ ප්‍රවාහනයේදී ඇතිවන රථවාහන තදබදයට සහන සැලසීම ව්‍යාපෘතියේ අරමුණු වේ. කොළඹ මාර්ගවල බහාලුම් ගෙනයාමේදී අපේක්ෂාකරන අඩුවීම නිසා, කොළඹ තදාසන්න ප්‍රදේශවල රථවාහන තදබදයද ලිහිල්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ණය ගිවිසුම ප්‍රකාරව මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 56,815.2 කට සමාන එජඩො මිලියන 360ක් අතර ඉන් රු. මිලියන 47.346 කට සමාන එජඩො මිලියන 300 ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව විසින් එකග වී තිබුණි. ඉතිරිය මුදල වූ රු. මිලියන 9,469.2 කට සමාන එජඩො මිලියන 60ක් සැපයීමට ශ්‍රී ලංකා රජය එකග වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 පෙබරවාරි මස ආරම්භ කරන ලද අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය 2016 මාර්තු මාසයේදී ලැබී තිබුණි. ව්‍යාපෘතිය 2025 වර්ෂයේ ජුනි 30 දින නිම කිරීමට නියමිතය.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

මාගේ වාර්තාවේ 2.1 වගුවේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය හා කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබදව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

| | ගිණුම්කරණ අඩුපාඩු | මුදල<br>රු.මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | මෙරිටයිම් ෆැසිලිටි ගොඩනැගිල්ලේ කොන්ත්‍රාත්කරුට නිරවුල් කිරීමට අවශ්‍ය ගෙවීම මත කරන ලද අධි වෙන්කිරීම හේතුවෙන් ජංගම වගකීම් රු.මිලියන 94කින් වැඩියෙන් දක්වා තිබුණි. | 94 | පිළිගනි. 2022 මූල්‍ය ප්‍රකාශනවල වෙනස ගැලපීම් කරනු ලැබේ. | ගිණුම් කාලපරිච්ඡේදය අවසානයේ දී නිවැරදි වගකීම හඳුනාගැනීම අවශ්‍ය වේ. |
| (ආ) | 2021 වර්ෂය සඳහා රු.820,194ක පිරිවැයකට මිලදීගත් දේපල පිරියත හා උපකරණ ව්‍යාපෘතියේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන කටයුතු යටතේ නිසිපරිදි අනාවරණය කර නොතිබුණි. | 0.82 | පිළිගනි. එකතුව රු.695,780 මුදල් ප්‍රවාහයේ කාර්යාල උපකරණ මිලදී ගැනීම ලෙස ඇතුළත් කර ඇත. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 සමග අනුකූල වීම අවශ්‍ය වේ. |

**3.** **භෞතික කාර්යසාධනය**

**3.1** **ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික හා මූල්‍ය කාර්ය සාධනය**

| | සංරචකය | 2021 දෙසැම්බර් 31 දිනට<br>අපේක්ෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය | අත්කරගත් කාර්යසාධනය ප්‍රතිශතය | විගණන ගැටලුව | ප්‍රමාද සඳහා හේතු |
|---|---|---|---|---|---|
| (අ) | කොන්ක්‍රීට් කණුමත දිවෙන වරාය ප්‍රවේශ මහා මාර්ගයේ ඉදිකිරීම් කටයුතු | 26.3 | 23 | සත්‍ය ප්‍රගතිය අපේක්ෂිත ප්‍රගතියට පිටුපසින් පැවතුණි. | කොන්ත්‍රාත්කරුගේ අඩු කාර්ය සාධනය සහ<br>රටේ පැවති කොවිඩ් - 19 තත්ත්වය |
| (ආ) | 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලසුම් ඇතුළත් රු. මිලියන 38,605ක් වටිනා කටයුතු 7 | 2019 – 2021 කාලය තුළදී ආරම්භ කිරීමට අපේක්ෂිත විය. | මාස 2-24 කින් ප්‍රමාද වී ඇත. | ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාදයන් සහිතව ආරම්භ කර තිබුණි. | සඳහන් කර නොමැත. |

**කළමනාකරණයේ ප්‍රතිචාරය** පිළිගනි. කණු මත ඉදිවෙන වරාය පිවිසුම් මාර්ගයේ ප්‍රගතිය 2021 දෙසැම්බර් අවසානයේ දී 23.2% විය. අයිතම 1-6 සහ 13 හැර අයිතම 3 මාස 2-24කින් ප්‍රමාද විය.

**විගණකගේ නිර්දේශය** කොන්ත්‍රාත්කරුගේ සම්පත් වැඩිකිරීමට පියවර ගත යුතු අතර ඉදිකිරීම් ප්‍රමාදයන් හේතුවෙන් දරන අමතර පිරිවැය අවම කිරීමට ඉදිකිරීම් කටයුතු ඉලක්ගත දිනයන්ට නිමකළ යුතුය.

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් මාසයේ ප්‍රගති වාර්තා අනුව, 2021 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළයුතු මුළු සැලසුම් ගණන 918ක් වේ. කෙසේවෙතත්, 2021 දෙසැම්බර් අවසාන වනවිට අපේක්ෂිත සැලසුම්වලින් සියයට 31ක් නියෝජනය කරන සැලසුම් 285ක් නිමකර නොතිබුණි. තවද, capping deam සැලසුම් සහ decks සැලසුම් නිමකිරීමේ ප්‍රගතිය මන්දගාමී වූ අතර 2021 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් සියයට 14ක් සහ සියයට 23ක් විය. | කොන්ත්‍රාත්කරුගේ වැඩ සටහන් සංශෝධනය 4 අනුව, 2021 දෙසැම්බර් අවසානය වන විට ඉදිරිපත් කළ යුතු මුළු සැලසුම් ගණන 918 වේ. ඒ අනුව 2021 දෙසැම්බර් අවසාන වන විට සැලසුම් කළ ගණනින් 31% නියෝජනය කරන 285 සැලසුම් නිම කර නොතිබුණි. capping deam සැලසුම් සහ decks සැලසුම්වල ප්‍රගතිය පිළිවෙලින් 14% සහ 23% වේ. | ඉලක්කගත දිනයන්ට ඉදිකිරීම් කටයුතු නිම කිරීමට වැඩ සටහනට අනුව සැලසුම් කටයුතු නිමකිරීම අවශ්‍ය වේ. |
| (ආ) | කොන්ත්‍රාත්කරුගේ සැලසුම් කටයුතු ඉදිකිරීම් කටයුතුවලට සහ නිම කිරීමේ දිනයන්ට ප්‍රධාන වශයෙන් බලපානු ලැබේ. කෙසේවෙතත්, සැලසුම් වෙනස් කිරීමට කොන්ත්‍රාත්කරුගේ සුදුසුකම්ලත් වැඩබිම් පුද්ගලයින් නොමැති වීම, මහාමාර්ග සැලසුම් කණ්ඩායම හොංකොං සිට වැඩ කිරීම සහ ඔවුන් වැඩබිම් තත්ත්වය අනුව අවශ්‍ය සැලසුම් වෙනස් කිරීමකට යොමු නොවීම. කොන්ත්‍රාත්කරු විසින් අදාළ ප්‍රමිතීන් සහ මාර්ගෝපදේශ භාවිතා නොකිරීම වැනි හේතු කිහිපයක් නිසා කොන්ත්‍රාත්කරුගේ සැලසුම් කටයුතු පිළිබඳ ඉංජිනේරුවන් විසින් තෘප්තිමත් වී නොතිබුණි. | සැලසුම්වල මූලික ඉදිරිපත් කිරීම්වල ගුණත්වය සහ ප්‍රගතිය මත කොන්ත්‍රාත්කරුගේ ප්‍රධාන සැලසුම් කණ්ඩායම ශ්‍රී ලංකාවේ නොමැතිව බලපෑමක් පවතින බව නිවැරදි වේ. මෙය සැලසුම් සඳහා කාලය ගත වීම සහ ඉදිරිපත් කිරීම් ගණන වැඩිවීමට හේතු වී තිබුණි. | ඉලක්කගත දිනයන්ට ව්‍යාපෘතියේ කටයුතු නිමකිරීමට උපදේශක ඉංජිනේරු සමග සාකච්ඡා කළ යුතු අතර කොන්ත්‍රාත්කරුගේ කටයුතු පිළිබඳ සුපරීක්ෂණයක් සිදුකළ යුතුය. |
| (ඇ) | කණු මත ඉදිවෙන වරාය පිවිසුම් මහා මාර්ග ව්‍යාපෘතියේ විදේශ ණය උපයෝජනය සඳහා 2021 වර්ෂයේ දී මහා භාණ්ඩාගාරය විසින් රු.මිලියන 19,393 ක ප්‍රතිපාදනයක් වෙන්කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් ව්‍යාපෘතිය විසින් 77% නියෝජනය කරන රු.මිලියන 14,891ක ප්‍රතිපාදන මුදලක් උපයෝජනය කර නොතිබුණි. තවද, ඉහත හේතූන් නිසා ව්‍යාපෘතිය විසින් සියයට 73ක් නියෝජනය කරන රු.මිලියන 4,302ක ප්‍රතිපාදන මුදලක් උපයෝජනය කර නොතිබුණි. | පිළිගනී.<br>රටේ පැවති කොවිඩ් 19 තත්වය සහ වැඩ බිමේ අනපේක්ෂිත උපයෝගිතා හේතුවෙන් ව්‍යාපෘතියේ පසුගිය කාලච්ඡේදය තුළදී කොන්ත්‍රාත්කරුගේ කාර්ය සාධනය දැඩි ලෙස බලපා තිබුණි. මෙය ප්‍රතිපාදන ඌන උපයෝජනය සඳහා ප්‍රධාන හේතුවක් විය. | ඉකුත් වීමට පෙර මුළු ණය පහසුකම් උපයෝජනයට මූල්‍ය සැලැස්ම තුළ ප්‍රතිපාදිත අරමුදල් භාවිතයට අවශ්‍ය පියවර ගත යුතුය. |

**3.3** **මානව සම්පත් කළමණාකරණය සම්බන්ධ ගැටලු**

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘති කාර්යමණ්ඩලය සාමාජිකයින් 10 දෙනෙකුගෙන් සමන්විත වී තිබුණ ද, මහාභාණ්ඩාගාරයේ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් කාර්ය මණ්ඩලය 30ක් අනුමත කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ 01, ප්‍රධාන ඉංජිනේරු 01, ප්‍රධාන ඉංජිනේරු 02 ගණකාධිකාරි 01 සහ ව්‍යාපෘති ලේකම් 01කළමනාකාර සහකාර 03 වැනි ප්‍රධාන තනතුරු ඇතුළුව පුරප්පාඩු 20ක් පැවතුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය අතර බලය පැවරීම සහ වගකීම පැවරීමේ සහ ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ ඉහළ අභ්‍යන්තර පාලනයක් සකස් කිරීමට අහිතකර ලෙස බලපා තිබුණි. | සැලසුමේ තනතුරු 30ක් හඳුනාගෙන තිබුණද ප්‍රසම්පාදනයන්ගේ ප්‍රමාදයන් හේතුවෙන් 2020 දී සියලුම කාර්ය මණ්ඩල තනතුරු අවශ්‍ය නොවේ. | ව්‍යාපෘතියේ අවශ්‍යතාවයට අනුව අවශ්‍ය කාර්යමණ්ඩලය බඳවා ගැනීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |